**තිහගොඩ ප්‍රාදේශීය සභාව**
**<u>මාතර දිස්ත්‍රික්කය.</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට **තිහගොඩ** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.404,347 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලදී. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන තිබූ රු.68,250 ක් වටිනා ලී බඩු හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලදී. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි නවීකරණය වෙනුවෙන් දරා තිබූ රු.1,263,981 ක වියදම ගිණුම්ගත කර නොතිබුණි. | සියලු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලදී. |
| (iv) | පසුගිය වර්ෂයේ ලංකාතිලක පෙර පාසලේ ගොඩනැගිල්ල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමේදී අඩුවෙන් ගිණුම්ගත කරන ලද රු.81,995 ක් සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | සියලු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක නොකරන ලද කර්මාන්තයකට අදාලව ගෙවිය යුතු වියදම ලෙස රු.49,937 ක් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලදී. |
| (vi) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 07 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.618,301 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලදී. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි රු.97,686 ක් සඳහා අඩුවෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන ලදී. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.64,913,282 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.1,104,535 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 අවසාන ගිණුමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,735,636 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | මෙම ගිණුම් විෂයයන් සඳහා ලේඛණ යාවත්කාලීන කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පෙන්වා දෙන ලද වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,791,829 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.1,260,925 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,180,500 | 569,715 | 544,915 | 272,365 | 1,088,000 | 372,456 | 310,624 | 247,565 |
| කුලී | 2,710,000 | 3,023,800 | 3,024,050 | 236,254 | 4,027,000 | 290,075 | 315,410 | 236,504 |
| බලපත්‍ර ගාස්තු | 815,800 | 882,251 | 901,671 | 5,510 | 776,800 | 881,911 | 866,442 | 24,930 |
| වෙනත් ආදායම් | 17,264,750 | 12,541,886 | 13,910,800 | 8,710,000 | 22,310,750 | 12,861,134 | 14,320,961 | 10,078,914 |
| එකතුව | 23,971,050 | 17,017,652 | 18,381,436 | 9,224,129 | 28,202,550 | 14,055,576 | 15,813,437 | 10,587,913 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත මුළු ආදායම රු.23,971,050 ක් වූ අතර බිල් කළ ආදායම රු.17,017,652 ක් විය. රු.10,587,913 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.27,605,565 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.18,381,436 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.9,224,129 ක් වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | රු.9,224,129 ක ශේෂය තුළ බිල් කරන ලද මුද්දර ගාස්තු රු.8,400,000 ක් හා උසාවි දඩ රු.300,000 ක් වන අතර ශේෂය වූ රු.524,129 ක මුදල අයකර ගැනීම සඳහා මේ වන විට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. |

**2.2.3 කඩ කුලී**

-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟය රු.211,504 ක් වූ අතර, රු.951,125 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.1,162,629 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.939,375 ක් වීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයට රු.223,254 ක හිඟ ශේෂයක් පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 81 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මුළු බිල්කිරීම් අයකර ගැනීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, ගෙවීම් නොකරන අය සඳහා නීතිමය කටයුතු කිරීමටද පියවර ගෙන ඇත. |

## 2.2.4 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟ ශේෂය රු.234,359 ක් වූ අතර රු.338,614 ක් වූ බිල් කිරීම් සමඟ රු.572,973 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයකිරීම් රු.314,643 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.258,330 ක හිඟයක් පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 55 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේ බිල්කරන ලද මුළු මුදල අයකර ගැනීමටත් පෙර වර්ෂයේ සිට පැවත එන හිඟ ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහාත් ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. |

## 2.2.5 වෙනත් ආදායම්

### උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.600,000 ක් හා මුද්දර ගාස්තු රු.16,800,000 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මෙම උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂයන් ලබාදෙන මෙන් ලිඛිත ඉල්ලීම් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යවා ඇත. |

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1** **කාර්ය සාධන ඇගයීම**

------------------------

තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකරගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂය තුළදී තිරසර සංවර්ධනය සඳහා වූ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අප්‍රේල් 19 දිනැති අංක 3/2017 සහ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කළයුතු වුවද සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 මැයි 15 දින වන විට ඇඟිලි සළකුණු යන්ත්‍රය සභාව තුළ ක්‍රියාත්මක කිරීමට සියළු කටයුතු සිදුකෙරෙමින් පවතී. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 05 ක් සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත තනතුරු 02 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | අනුමත තනතුරු වල පැවති පුරප්පාඩු 05 ක් මේ වන විට සම්පූර්ණ කර ගෙන ඇති අතර, අතිරික්ත තනතුරු 02 ක් අනුමත කර ගැනීම සඳහා අනුමැතියට යවා ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2017 මාර්තු 03 දිනැති අංක 209 ගැසට් පත්‍රය මඟින් වර්ග කිලෝමීටර් 4.5 ක් දියුණු ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කර තිබූ නමුත් 2019 පෙබරවාරි 08 දින වන විටත් දේපළ තක්සේරුව සිදුකර වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 අප්‍රේල් 22 දින වරිපනම් තක්සේරු කටයුතු සඳහා පැමිණෙන බවට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. |
| (ආ) | තිහගොඩ ප්‍රාදේශීය සභාවේ මහජන පොළ පවත්වා ගෙන යන ඉඩම අත්කර ගැනීම සඳහා මූලික තක්සේරු මුදල වශයෙන් රු.5,650,000 ක් 2012 අප්‍රේල් 26 වන දින තිහගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණද, 2019 පෙබරවාරි 08 දින වන විටත් පොළ භූමිය සභාවට පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීම කඩිනමින් සිදු කළ යුතුවේ. | තිහගොඩ මහජන පොළ පිහිටි භූමිය රජයට පවරා ගැනීම පිළිබඳ විරෝධතාවක් නොමැති බව දන්වා පළාත් පාලන සහකාර කොමසාරිස් මඟින් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ |

| | | |
|---|---|---|
| | | අමාත්‍යාංශයේ ලේකම් වෙත 2019 මාර්තු 19 දිනැති ලිපිය මඟින් දන්වා යවා ඇත. |

**3.5 මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 02 දිනැති දකුණු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණ අංක 781 ප්‍රකාරව 2017 ඔක්තෝබර් 24 දිනැති දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/03/12/19 දරණ ලිපිය සහ 2017 ඔක්තෝම්බර් 24 දිනැති දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක 03/03/සභා/පොදු/2017 ලිපිය ප්‍රකාරව සංචිත වාහන සඳහා තුන්වන පාර්ශවයේ රක්ෂණාවරණ ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 14 දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 05 ප්‍රකාරව සභාව සතු වාහන දෙකක් සඳහා පූර්ණ රක්ෂණාවරණය ලබාගෙන තිබුණි. | ලිපි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2018 අගෝස්තු 14 දින පැවති මහා සභාවේ තීරණය පරිදි පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන ඇත. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 06 ක ඉතිරිවීම් වල එකතුව රු.11,856,801 ක් වූ අතර එම අගයන් සියයට 15 සිට සියයට 76 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | අදායම් විෂයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.93,101 ක් වූ අතර එම අගයන් සියයට 22 සිට සියයට 82 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |